# 5 ආදි පිතෘ ආබ්‍රහම් තුමාගේ කැඳවීම



5.1 රූපය - ආබ්‍රහම් තුමා

ආදම් හා ඒව පව් කළ පසු ගැලවුම්කරුවකු එවා මනුෂ්‍ය සංහතිය පාපයෙන් ගලවා ගැනීමට දෙවියන් වහන්සේ පොරොන්දු වූ සේක. එම පොරොන්දුව ඉටු කිරීමට දෙවියන් වහන්සේ තෝරාගත් පළමු තැනැත්තා වන්නේ, ආබ්‍රහම් තුමා ය. එතුමා ආදි පිතෘවරයකු ලෙස හැඳින්වේ. එලෙස දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමා තෝරා ගනු ලැබීම එතුමාට දුන් විශේෂ කැඳවීමෙන් ආරම්භ වේ. එම කැඳවීම ශුද්ධ බයිබලය මෙසේ වාර්තා කරයි.

සමිඳාණන් වහන්සේ ආබ්‍රම්ට කතා කොට, "නුඹේ මව් බිම ද නුඹේ නෑදෑයන් ද නුඹේ පියාගේ ගෘහය ද අත්හැරදමා, මා පෙන්වන්නට යන දේශයට යන්න. මම නුඹ මගින් විශාල ජාතියක් ඇති කරන්නෙමි; මම නුඹට ආශීර්වාද කරන්නෙමි; නුඹේ නාමය ආසිරි පැතීමේ නාමයක් වන සේ කීර්තියට පමුණුවන්නෙමි. ........... ආබ්‍රම්ට වයස අවුරුදු හැත්තෑපහක් වූ කල සමිඳාණන් වහන්සේ ඔහුට වදාළ ලෙසට, ඔහු හාරාන් දේශයෙන් පිටත් විය. ලොත් ද ඔහු සමග ගියේ ය. මෙසේ ආබ්‍රම් සිය බිරිඳ වන සාරයි ද තම සොහොයුරාගේ පුත් වන ලොත් ද හාරාන් දේශයෙන් රැස් කරගත් සියලු සම්පත් හා දැසිදසුන් ද රැගෙන කානාන් දේශය බලා නික්ම ගොස් එහි සැපත් විය. .... එවිට සමිඳාණන් වහන්සේ ආබ්‍රම්ට දර්ශනය වී, ඔහුට කතා කොට, "මම මේ දේශය නුඹේ පෙළපතට දෙන්නෙමි"යි වදාළ සේක.

(උත්පත්ති 12:1-2,4-5,7)

ආබ්‍රහම් තුමාගේ ගම ඌර් විය. එතුමා තම පියා හා නැදෑයන් සමග ජීවත් වූයේ හාරාන්හි ය. හාරාන්හි ජීවත් වන විට එතුමා දෙවියන් වහන්සේගෙන් විශේෂ කැඳවීමක් ලබයි. එම කැඳවීම අනුව එතුමාට යාමට සිදුවන්නේ කානාන් දේශයට ය. එය "පොරොන්දු දේශය" යනුවෙන් ද හැඳින්වේ. පහත සිතියමෙන් ඌර්, හාරාන් හා කානාන් හඳුනා ගන්න.




ආබ්‍රහම් තුමාගේ කැඳවීමේ අංග දෙකකි.

1. පරිත්‍යාග
2. අභියෝග



ආබ්‍රහම් තුමාට තම මව්බිම, නෑදෑයන් හා පියාගේ ගෘහය හැර දමා දෙවියන් වහන්සේ පෙන්වන කානාන් දේශයට යාමට සිදු විය. තම දුක සැප වේදනාව හෝ සතුට බෙදා ගැනීමට ඥාතීන් හා ඇසුර අවශ්‍ය වුව ද සියල්ල අතහැර දෙවියන් වහන්සේ කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තබා මේ ගමන යා යුතු විය. ආබ්‍රහම් තුමා දෙවියන් වහන්සේගෙන් ලද කැඳවීම සම්පූර්ණයෙන් ම විශ්වාස කළේ ය. එම නිසා ආබ්‍රහම් තුමා "විශ්වාසයේ පියා" ලෙස හැඳින්වේ. දෙවියන් වහන්සේ කෙරෙහි පූර්ණ විශ්වාසය රඳවා ක්‍රියා කිරීමට අපට ද මේ සිද්ධිය මහඟු ආදර්ශයකි.




දරුවකු නොමැති ව මහලු වියේ පසු වූ ආබ්‍රහම් තුමා මගින් විශාල ජාතියක් ඇති කිරීමට යන බවට දෙවියන් වහන්සේ පැවසූ පොරොන්දුව ආබ්‍රහම් තුමා නොපැකිල පිළිගත්තේ ය. හාරාන් දේශයෙන් රැස් කර ගත් සියලු සම්පත් හා දැසි දසුන් රැගෙන සැතපුම් 800ක් (කිලෝමීටර් 1300ක්) පමණ දුර පිහිටි තමන් නොදන්නා කානාන් දේශය කරා ගමන් කිරීමට ඔහුට සිදු විය. මේ සියල්ල ආබ්‍රහම් තුමා මුහුණ දුන් අභියෝග ය.

### ආබ්‍රහම් තුමා ලද දේව පොරොන්දු

දෙවියන් වහන්සේගේ හඬට සවන් දී ඒ අනුව ජීවත් වන විට යම් යම් දේ පරිත්‍යාග කිරීමට සිදු වේ; යම් යම් අභියෝගයන්ට මුහුණදීමට සිදු වේ. එහෙත් සියල්ල පරිත්‍යාගවලින් හා අභියෝගවලින් අවසන් නොවේ.

දෙවියන් වහන්සේගේ ආශිර්වාදය දේව කැමැත්තට අවනත වන්නාට ලැබේ. ආබ්‍රහම් තුමා දෙවියන් වහන්සේගෙන් ලබන්නට යන වරප්‍රසාද එතුමා දෙවියන් වහන්සේගෙන් ලද පොරොන්දුවලින් ප්‍රකාශ වේ. එවැනි පොරොන්දු දෙකකි. ඒවා නම්;

1. ආබ්‍රහම් තුමා මගින් විශාල ජාතියක් ඇති කිරීම
2. ආබ්‍රහම් තුමාගේ පෙළපතට දේශයක් දීම

ආබ්‍රහම් තුමාට වයස අවුරුදු 75 විය. එතුමාගේ බිරිඳ වූ සාරාට වයස අවුරුදු 65ක් විය. දේව පොරොන්දුවේ අරමුණ වූයේ වයස්ගත ඔවුනට දරුවකු ලබා දී විශාල ජාතියක් ඇති කරන්නටයි. එම පොරොන්දුවට අනුව ඇති වූ විශාල ජාතිය වූයේ ඉශ්‍රායෙල් ජාතිය යි. ඔවුනට දුන් පොරොන්දුව අනුව ලැබුණු දේශය වූයේ පොරොන්දු දේශය යි.

## ආබ්‍රහම් තුමාගේ කැඳවීම තුළින් ගත හැකි ආදර්ශ

- දෙවියන් වහන්සේ විවිධ කාර්යයන් සඳහා ශිෂ්‍යයන් වන ඔබ කැඳවන සේක. එම කැඳවීමට අවනත වීම සඳහා ඔබ සූදානම් ව සිටිය යුතු ය.
- ලැබෙන කැඳවීමට අනුව හැකි උපරිමයෙන් දෙවියන් වහන්සේට සේවය කළ යුතු ය.
- දෙවියන් වහන්සේ කෙරෙහි පූර්ණ විශ්වාසය තබා දේව වචනය පිළිගැනීම හා ඒ අනුව ජීවිතය හැඩ ගස්වා ගත යුතු ය.
- අපගේ ජීවිත ගමනේ දී විවිධ දේ පරිත්‍යාග කිරීමට සිදු වන බව පිළිගත යුතු ය.
- අපගේ ජීවිතයේ තීරණාත්මක අවස්ථාවල දී දේව කැමැත්ත පිළිගෙන ජීවිත වෙනසක් ඇති කර ගත යුතු ය.
- අපට ලැබෙන ජීවිත අභියෝගවලට සාර්ථක ව මුහුණදීම සඳහා දෙවියන් වහන්සේට නිරතුරු ව යාච්ඤා කළ යුතු ය.

## ක්‍රියාකාරකම

1. ආබ්‍රහම් තුමාගේ කැඳවීමේ අංග **දෙක** ලියන්න.
2. විශ්වාසය හීන වූ ඔබේ මිතුරකුට හෝ මිතුරියකට දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමට ඔබ මඟ පෙන්වන්නේ කෙසේදැයි කරුණු **තුනකින්** ලියා දක්වන්න.
3. පහත සඳහන් අවස්ථාවල දී ඔබ එම අභියෝග ජය ගැනීමට ක්‍රියා කරන අන්දම ලියා දක්වන්න.
   - i. ඔබගේ හොඳ ම මිතුරා ඔබ සමග අමනාප වූ විට
   - ii. ඔබ ක්‍රීඩා තරගයකින් පරාජය වූ විට
   - iii. විනෝද චාරිකාවක් යාමට දෙමව්පියන්ගේ අවසරය නොලැබූ විට
   - iv. ඔබගේ මව ආසාධ්‍ය රෝගයකින් පෙළෙන විට
   - v. ඔබේ ජීවිතය දුක් කරදරවලින් පිරී යන විට
4. ආබ්‍රහම් තුමාට දෙවියන් වහන්සේ දුන් පොරොන්දු **දෙක** ලියන්න.
5. ආබ්‍රහම් තුමාගේ ජීවිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ **තුනක්** ලියන්න.



### ජීවිතයට බිඳක්

- *එදිනෙදා ජීවිතයේ දී ලැබෙන කැඳවීම් පිළිගනිමු.*
- *එදිනෙදා ජීවිතයේ සෑම අවශ්‍යතාවක් උදෙසා ම විශ්වාසයෙන් දෙවිඳුන් වෙත හැරෙමු.*
- *අභියෝගවලට විශ්වාසයෙන් මුහුණ දෙමු.*
- *විශ්වාසය තුළ දිව්‍ය සංරක්ෂණය අත්දකිමු.*



නොමිලේ බෙදහැරීම සඳහා ය.